ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක : 03/2026

මගේ අංක : COM/Trans/V/වා.ස්.මා./2026
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2026.05.27

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම**

ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු විවිධ හේතූන් මත ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මෙන්ම අදාළ නිලධාරීන් ඇතුළු විවිධ පාර්ශ්වයන් විසින් ඒකාබද්ධ සේවා අංශයෙන් විමසීම් කරනු ලැබේ. ඒ පිළිබඳව පැන නැඟී ඇති ගැටළු මඟහරවා ගැනීමට අවශ්‍ය වන උපදෙස් හා මඟ පෙන්වීම් ලබාදීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ස්ථාන මාරු පටිපාටිය අනුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය මඟින් නිලධරයන්ට විවිධ සේවා ස්ථාන වෙත ස්ථාන මාරුවීමට අවස්ථාව සලසා දෙන අතර එමඟින් නිලධරයන් අභිප්‍රේරණය වීම මෙන්ම ආයතනවල සේවා අවශ්‍යතාව ඉටුවීමද සිදුවේ.

03. ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියේ ප්‍රධාන පියවර පහත පරිදි වේ

i. **ඒකාබද්ධ සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය ප්‍රසිද්ධ කිරීම හා ඒ අනුව අයදුම්පත් කැඳවීම.**

වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීමෙන් අනතුරුව මාර්ගගතව අයදුම්පත් කැඳවීම සිදු කරන අතර එම අවස්ථාවේදී අදාළ අයතනයන්හි වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන්ගේ ලේඛන, සේවා අවශ්‍යතාව මත රඳවාගැනීම නිර්දේශ කරන නිලධරයන් පිළිබඳ තොරතුරු (ප්‍රියමනාප සේවා ස්ථානවලට මෙම කරුණ අදාළ නොවේ), ප්‍රසූති නිවාඩු/ වැටුප් රහිත නිවාඩු ලබා ඇති නිලධරයන්ගේ තොරතුරු හා ස්ථාන මාරුවලට බලපාන වෙනත් විශේෂ කරුණුද යොමු කළ යුතු වේ.

එසේවුවද මෙහිදී පහත අඩුපාඩු නිරීක්ෂණය වේ.

a. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමේදී නිලධරයාගේ වර්තමාන සේවා ස්ථානය, පූර්ව සේවා ස්ථාන හා එම සේවා ස්ථානවලට අදාළ කාලසීමාවන් නිවැරදිව ඇතුළත් නොකිරීම.
b. ස්ථාන මාරු ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථාන නිවැරදිව තෝරා නොගැනීම.
c. රඳවාගත යුතු නිලධරයන් පිළිබඳව දැනුම් නොදීම.

d. ප්‍රසූති නිවාඩු/ වැටුප් රහිත නිවාඩු ලබා ඇති නිලධරයන්ගේ තොරතුරු දැනුම් නොදීම.

මෙම අඩුපාඩු හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු තීරණ ලබා දුන් පසු අදාළ වාර්ෂික ස්ථාන මාරු චක්‍රවල ඇතුළත් වන අනෙකුත් නිලධරයන් මෙන්ම එම සේවා ස්ථානද අගතියට පත්වේ.

ii. **ඒකාබද්ධ සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු තීරණ නිකුත් කිරීම හා එම තීරණ අනුව අභියාචනා කැඳවීම.**

වාර්ෂික ස්ථාන මාරු තීරණ නිකුත් කිරීමෙන් පසු එම තීරණ සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන සියලුම නිලධරයන් සමාලෝචන කමිටු වෙත මාර්ගගතව අභියාචනා ඉදිරිපත් කළ යුතුවේ.

iii. **ඒකාබද්ධ සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් සමාලෝචන කමිටු වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බලා තීරණ ලබාදීම හා සමාලෝචන කමිටු තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධරයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීම.**

a. සමාලෝචන කමිටු වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බලා තීරණ ලබාදීමෙන් අනතුරුව එයින්ද සෑහීමකට පත් නොවන සියලුම නිලධරයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මාර්ගගතව අභියාචනා ඉදිරිපත් කළ යුතුවේ.

b. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අභිනියෝජනය කර ඇති බලතල ප්‍රකාරව ගෙන ඇති තීරණයක් ක්‍රියාත්මක නොකර සිටීමේ හෝ සංශෝධනය කිරීමේ හෝ කල්දැමීමේ බලතල වෙනත් ආයතන ප්‍රධානීන් සතුව නොමැති බැවින් කිසියම් නිලධරයෙකු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා නොකරයි නම් එම නිලධරයා සමාලෝචන කමිටු මඟින් ලබාදුන් තීරණය පිළිබඳව සෑහීමට පත්ව ඇති බවට නිගමනය කරනු ලැබේ. ඒ සම්බන්ධයෙන් නැවත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අභියාචනා කිරීමට හැකියාවක් නොමැති අතර එවැනි නිලධරයන්ට ලබාදී ඇති සමාලෝචන කමිටු තීරණය එලෙසම ක්‍රියාත්මක කළ යුතු වේ.

c. එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(3) ව්‍යවස්ථාවට අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගෙන ඇති තීරණයක් ක්‍රියාත්මක නොකර සිටීමේ හෝ සංශෝධනය කිරීමේ හෝ කල්දැමීමේ බලතල වෙනත් ආයතන ප්‍රධානීන් සතුව නොමැති බැවින් වාර්ෂික ස්ථාන මාරු තීරණ නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම ආයතන ප්‍රධානීන්ගේ මෙන්ම අදාළ නිලධාරීන්ගේද වගකීමක් වේ.

d. තම අභියාචනය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද තීරණයෙන්ද අතෘප්තියට පත්වන නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත. නමුත් ඒ සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණය ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතුය.

e. වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් සමාලෝචන කමිටු වෙත හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත තම අභියාචනා ඉදිරිපත් කිරීමෙන් තොරව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කරන අවස්ථාවේදී නිලධරයාගේ පෞද්ගලික අවශ්‍යතා හෝ සේවා අවශ්‍යතා දක්වමින් අභියාචනා ඒකාබද්ධ සේවා අංශය වෙත ඉදිරිපත් නොකළ යුතුය.

f. ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු තීරණ නියමිත දිනටම ක්‍රියාත්මක කිරීම අනිවාර්ය වේ. වාර්ෂික ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන්ගේ අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් හෝ වෙනත් කිසිදු හේතුවක් මත අදාළ වාර්ෂික ස්ථාන මාරු කල්දැමීමට හෝ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක නොකර සිටීමට කටයුතු නොකළ යුතු බව අවධාරණය කරනු ලැබේ.

04. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු පොදු කරුණු.

i. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් කිසියම් නිලධරයෙකු තම අභියාචනයක් ඉදිරිපත් කිරීමේදී ආයතන සංග්‍රහයේ XXVIII වන පරිච්ඡේදයේ 5 සහ 6 වගන්තිවල දැක්වෙන කරුණු අනුව තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

ii. තවද තම ආයතන ප්‍රධානියාගේ අනුදැනුමකින් තොරව සෘජුව අභියාචනා ඉදිරිපත් කරන නිලධරයන් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 06/2015 හි දැක්වෙන විධිවිධානවලට අනුව විනයානුකූලව කටයුතු කළ හැකිය.

iii. ස්ථාන මාරු සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වයන් මඟින් බලපෑම් කිරීම, ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVII වන පරිච්ඡේදයෙහි 1.6 වගන්තිය අනුව විනයානුකූලව කටයුතු කළ යුතු ක්‍රියාවක් ලෙස සලකා කටයුතු කළ යුතුය.

05. රාජ්‍ය සේවයේ පවත්වා ගත යුතු නෛතික ස්වභාවයන්ට බාධා නොවන පරිදි ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම චක්‍රලේඛයෙහි ඇතුළත් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කිරීමට සියලුම ආයතන ප්‍රධානීන් මෙන්ම ඒකාබද්ධ සේවාවන්ට අයත් සියලු නිලධරයන්ද කටයුතු කළ යුතු වේ.

06. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි නිකුත් කරනු ලැබේ.



එන්.යූ. නිෂාන් මෙන්ඩිස්
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය